**මාතලේ මහා නගර සභාව - 2021**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 අහිතකර මතය
**-----------------**

මාතලේ මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට මාතලේ මහා නගර සභාවේ මූල්‍ය  තත්ත්වය  සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම
**------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර  පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ ඔ, ඕ හා ක නිරීක්ෂණ හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මුදල් භාරකරු භාරයේ පැවැති රු.526,148 ක අතැති මුදල්, ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි. | මෙම දෝෂය ඉදිරියේදී බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී නිවැරදිකර ගන්නා බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු, අගය එකතු කිරීමේ බදු හා ජාතිය ගොඩනැගීමේ බදු එකතුව රු.2,760,820 ක් ණයහිමියන්ගෙන් අඩුකර දක්වා තිබුණු බැවින් ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි. | මෙම වටිනාකම ඉදිරියේදී ණයගැතියන් හා ණයහිමියන් යටතේ ගිණුම්ගත කරන බව. | |
| (ඇ) | 2019 වර්ෂය වෙනුවෙන් ලැබියයුතු තානායම් කුලී රු.1,334,567 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණු අතර, 2020 වර්ෂය වෙනුවෙන් ලැබියයුතු තානායම් කුලී රු.155,700 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු තානායම් කුලී හා සමුච්චිත අරමුදල රු.1,178,867 ක් බැගින් වැඩිපුර දැක්වේ. | 2022 වර්ෂයේ නිවැරදි කර ගන්නා බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.5,547,205 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සළකා ගිණුම්ගත කර තිබුණි. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් ලැබී තිබුණු උප ලේඛන අනුව ප්‍රවර්ථන වර්ෂයේ බිල්කිරීම් ලෙස ගිණුම් ගතකළ බව. | |

| | | | |
|---|---|---|---|
| (ඉ) | එකතු කිරීමේ අගය මත බදු ගිණුමේ ඉකුත් වසරවල දෝෂ නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් අංක 92 අනුව රු.168,308 ක් එකතු කිරීමේ අගය මත (වැට්) බදු ගිණුමට හර කර සමුච්චිත අරමුදලට බැර කරන බව දක්වා තිබුණ ද සමුච්චිත අරමුදල් ගිණුමට බැරකර නොතිබුණි. මෙසේ ගිණුම් තැබීම නිසා ගිණුම් තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවීය. | එකතු කිරීමේ අගය මත බදු ගිණුමේ ශේෂය හා සමුච්චිත අරමුදල අතර වෙනස ඉදිරියේදී නිරවුල් කර ගිණුම්ගත කරන බව. | |
| (ඊ) | සභාවට අයත් විහාරගම වත්ත ඉඩමට කසළ බැහැර කිරීමට අදාළ ව්‍යාපෘතියක, ශක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණු රු.400,000 ක්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා පුනරාවර්ථන වියදම් ලෙසට ගිණුම්ගත කළ යුතු වුවත්, එසේ නොකර ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේදී ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | |
| (උ) | සභා බලප්‍රදේශයේ පදිංචිකරුවන්ට සහනදායී පදනම මත බෙදාදීම සඳහා මිලදීගෙන තිබුණු කසළ රැස් කිරිමේ බඳුන් 300 ක රු.1,134,000 ක අගය අතැති තොග ලෙසට ගිණුම්ගත නොකර ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඌ) | නගරාධිපති නිල නිවස, වාහන අංගනයේ ඉහළ මහල, ගිනි නිවීමේ ඒකකය හා රියදුරු හා විදුලි අංශයේ කාමර ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණු එකතුව රු. 48,510,286 ක් හා සමාලෝචිත වර්ෂය තුළ දී මිලදීගෙන තිබුණු රු.7,532,630 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 25 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (එ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිකර මහා නගර සභාවට සමාලෝචිත වර්ෂයේ භාරදී තිබුණු ගෘහස්ථ ක්‍රීඩාංගනයේ හා පිහිනුම් තටාකයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් සඳහා තක්සේරු වාර්තා ලබාගෙන ගිණුම්ගත කරන බව. | |
| (ඒ) | මාතලේ නගරයේ රථවාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම සඳහා ගිවිසුම්ගත වූ පෞද්ගලික ආයතනයකින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් ලැබියයුතු රථ වාහන නවතා තැබීමේ ගාස්තු රු.633,433 ක් ගිණුම් ගතකර නොතිබුණි. | 2022 වර්ෂයේ ජනල් සටහන් මඟින් නිවැරදි කරන බව. | |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ඉකුත් වර්ෂයේ රු.19,123,258 ක සැපයුම් ණයහිමියන් ගිණුම්ගත කිරීම සඳහා ඉකුත් වර්ෂයේ ජ'නල් සටහන් අංක 14 හි සැපයුම් ගැණුම් ගිණුම හර කර සැපයුම් ණයහිමි ගිණුම බැර බව දක්වා තිබුණ ද, සැපයුම් ගැණුම් ගිණුම හර නොකිරීමේ දෝෂය සමාලෝචිත වර්ෂයේ ද නිවැරදිකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ඕ) | ඉකුත් වර්ෂයේ සැපයුම් ණයහිමියන්ගෙන් රු.5,541,043 ක් කපා හැරීම සඳහා එම වර්ෂයේ ජ'නල් සටහන් අංක 13 හි සැපයුම් ණයහිමියන් හර කර ගබඩා අත්තිකාරම් ගිණුම බැර කරන බව දක්වා තිබුණ ද ගබඩා අත්තිකාරම් ගිණුම බැර නොකිරීමේ දෝෂය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. | | |
| (ක) | 2019 වර්ෂයේ එක් එක් මාසය තුළ සමුච්චිත අරමුදල් ගිණුමට බැරවියයුතු එකතු වටිනාකම රු.16,673,586 ක් එම ගිණුමට හරකර තිබුණු අතර, එක් එක් මාසවල එම ගිණුමට හරකළ යුතු එකතු වටිනාකම රු.2,372,791 ක් එම ගිණුමට බැරකර තිබුණි. එසේ දෝෂ සහගතව ගිණුම්ගත කර තිබුණු ශේෂ නිවැරදි කිරීම සඳහා ඉකුත් වර්ෂයේ ජ'නල් සටහන් අංක 16 මඟින් එම වටිනාකම්වල දෙගුණය පිළිවෙළින් රු.33,347,172 ක් හා රු.4,745,582 ක් සමුච්චිත අරමුදල් ගිණුම හර කර එම ගිණුමටම බැර කිරීම හේතුවෙන් එම දෝෂය නිවැරදි වී නොතිබුණි. එමෙන්ම එම වරද සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. | | |

## 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.4,103,664 ක වෙනසක් නිරීක්ෂණය විය. | නොසැසඳීම් වලට අදාල වෙනස්කම් හඳුනාගෙන ඉදිරියේදී ගිණුම් නිවැරදි කරන බව. | ගිණුම්වල ශේෂ හා උපලේඛනවල ශේෂවල නොසැසඳීම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළයුතුය . |

## 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.89,585,589 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මෙම විෂයයන් වලට අදාල ලේඛන හා උප ලේඛන හඳුනාගෙන විගණනයට ඉදිරියේදී ඉදිරිපත් කරන බව. | අදාල ලේඛන හා උප ලේඛන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළයුතුය . |

## 1.7 අනුකූල නොවීම්

### නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2021 ජුනි 16 දිනැති අංක MH/Add/Sec/Admin1/ 16/202 දරන සෞඛ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය | කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය පාලනය සඳහා සක්‍රීයව මැදිහත්වන සෞඛ්‍ය සේවාවේ හා සෞඛ්‍ය කාර්යමණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් හා සේවකයින් වෙනුවෙන් රු.7,500 ක විශේෂ මාසික දීමනාවක් ලබාදිය හැකි බව සඳහන් වුවද, ඊට අනුකූල නොවන ලෙසට මහා නගර සභාවේ සෞඛ්‍ය අංශයෙන් පරිබාහිර අංශවල සේවය කරන නිලධාරීන් 14 දෙනෙකුට හා සේවකයින් 53 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ ජුනි මාසය සඳහා රු.7,500 බැගින් රු.502,500 ක දීමනා ගෙවා තිබුණි. | විශේෂ මාසික දීමනාව ලබාදීමේ හැකියාව ප්‍රධාන ලේකම්ගෙන් විමසීම් කර ඇතත්, පිළිතුරක් නොලද හෙයින් සේවකයින්ගේ ඉල්ලීම මත මහා සභා අනුමැතියකින් අධීකාරයට යටත්ව දීමනා ගෙවා ඇති බව. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා පමණක් දීමනා ගෙවිය යුතුය . |
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 5(i) ඡේදය | 2013 ජනවාරි 01 දිනෙන් පසුව සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 84 ක කඩ කුලිය තක්සේරුකර නොතිබුණු අතර බදු ගිවිසුම්වල 4(iii) ඡේදය අනුව බදු ගිවිසුම් අළුත් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | කඩ කාමර සඳහා තක්සේරු වටිනාකම් සංශෝධනය කර ගැනීමට 2021 දෙසැම්බර් 24 දිනැතිව පළාත් ප්‍රධාන තක්සේරුකරුට දන්වා ඇතත්, එකී තක්සේරුව ලැබී නොමැති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව නියමිත කාලය තුළ තක්සේරු වාර්තා ලබාගෙන කුලී සංශෝධනය කර ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කළයුතුය . |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.74,897,187 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.59,242,057 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.9,157,277 ක් හා මුද්දර ගාස්තු රු.35,528,800 ක් විය. | අයකර ගතයුතු මුදල් අයකර ගැනීමට ලිපි යොමුකර ඇති බව. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුය . |

#### 2.2.2 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.536,781 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අධිභාර මුදල් අයකර ගැනීමට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇතත්, මෙතෙක් උපදෙස් ලැබී නොමැති බව. | අධිභාර මුදල් අයකර ගතයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 24 දිනැති අංක 2018/05 දරන මධ්‍යම පළාතේ, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 2 වන ඡේදය අනුව මධ්‍යම පළාත්, | චක්‍රලේඛ උපදෙස් විධිමත් ක්‍රමවේදයන් අනුව මධ්‍යම පළාත් අනුගමනය කර ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛ උපදෙස් | |

| | | |
|---|---|---|
| ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව, මාතලේ මහා නගර සභාවේ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් මාස 06 ක කාලයක් සඳහා රු.1,600 ක දෛනික දීමනාවක් මත අවිධිමත්ව පුද්ගලයෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 23 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලයට එකතුව රු.115,200 ක දීමනා ගෙවා තිබුණි. | අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර, මෙවැනි හදිසි බඳවා ගැනීම් සඳහා ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතියක් ලබා ගන්නා බව . | අනුව බඳවා ගැනීමට කටයුතු කළයුතුය . |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක එකතුව රු.120,420,979 ක් අයකරගෙන නොතිබුණු අතර, ඊට අය නොකර පවතින කාලය වසර 1 ට අඩු ශේෂය රු.68,587,536 ක් ද, වසර 1 ට වැඩි හා 5 ට අඩු ශේෂය රු.33,790,168 ක් ද, වසර 5 ට වැඩි ශේෂය රු. 18,043,275 ක් ද ඇතුළත්ව තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ලැබියයුතු මුදල් අයකර ගතයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතුව රු.127,936,704 ක් නිරවුල් කර නොතිබුණු අතර, නිරවුල් නොකර පවතින කාලය වසර 1 ට අඩු ශේෂය රු.24,277,933 ක්ද , වසර 1 ට වැඩි හා වසර 5 ට අඩු ශේෂය රු.32,453,572 ක් ද, වසර 5 ට වැඩි ශේෂය රු.71,205,199 ක් ද එම ශේෂයට අතුළත්ව තිබුණි. | දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන ශේෂ ඉදිරියේදී නිරවුල් කරන බව. | ගෙවියයුතු ණය ශේෂ නිරවුල් කලයුතුය . |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (මහා නගර සභා) xxii වන කොටසේ 1(2) වගන්තියේ විධිවිධාන හා මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 229 (ආ) වගන්තියේ විධිවිධාන කෙරෙහි අවධානය යොමු නොකර සුපිරි වෙළඳ සංකීර්ණයේ හා ගොංභාවෙල පොදු වෙළඳ සංකීර්ණයේ අංක 32 හා 3 A දරන මස්කඩ ටෙන්ඩර් පරිපාටිය අනුගමනය නොකර ඉකුත් වර්ෂයේ වාර්ෂික කුලියට සියයට 10 ක් එකතු කර පිළිවෙලින් රු.1,991,194 කට හා රු.1,989,874 කට ව්‍යාපාර කරගෙන යන බදුකරුවන්ට සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 සිට නොවැම්බර් 01 දින දක්වා බදු දී තිබුණි. | තක්සේරු වාර්තා ලබා ගැනීම ප්‍රමාද වූ බැවින් වාර්ෂික කුලියට සියයට 10 ක් එකතු කර කුලී අය කිරීමට කටයුතු කර ඇති බව . | මහා නගර සභා ආඥා පනතේ හා සම්මත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර මස් කඩ බදු දීමට කටයුතු කළයුතුය . |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | වර්ග අඩි 12774 කින් යුතු මාතලේ නගරයේ සුපිරි වෙළඳ සංකීර්ණයේ දෙවන මහල බඳුදීම සඳහා 2014 වර්ෂයේ හා 2015 වර්ෂයේදී ටෙන්ඩර් කැඳවා ඉල්ලුම්කරුවන් 18 දෙනෙකුගෙන් ලබාගත් ආපසු ගෙවන තැන්පත් රු.180,000 ක් ද 07 දෙනෙකුගෙන් ලබාගත් මාස 3ක බදු කුලියට සමාන රු.241,068 ක ඇප තැන්පත් ද පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණද, එය ක්‍රියාත්මක නොකර සුපිරි වෙළඳ සංකීර්ණයේ දෙවන මහල නිෂ්කාර්යව පැවතුණි. | ලංසු කැඳවා සුදුසුකම් ලත් ලංසුකරුවන් තෝරා කඩ කාමර පවරා දීමට කටයුතු කරන බව . | නිසි ක්‍රියාමාර්ග අනුගමනය කර දෙවන මහලේ කඩ කාමර ඉදිකර භාවිතයට ගතයුතුය . |

## 3.4 මතබේදයට තුඩුදුන් ගනුදෙනු

---------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතලේ නගරයේ සුපිරි වෙළඳ සංකීර්ණයේ තෙවන මහලේ වර්ග අඩි 1000 ක භූමි ප්‍රමාණයක් රු.40,500 ක මාසික කුලියක් මත පෞද්ගලික උපකාරක පන්ති පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික ආයතනයකට විධිමත් බදු ගිවිසුමකින් තොරව 2016 මැයි මස බදු දී තිබුණි. එසේ වුවද 2016 මැයි සිට දෙසැම්බර් දක්වා වර්ග අඩි 1250 ක් ද 2017 ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දිනය දක්වා වර්ග අඩි 5000 ක් ද භාවිතා කර තිබුණි. එසේ වැඩිපුර භාවිතා කර තිබුණු භූමි ප්‍රමාණය සඳහා 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා කුලී වශයෙන් එකතුව රු.9,801,000 ක් අයකරගෙන නොතිබුණි. එසේම වර්ග අඩි 1000 ක භාවිතය වෙනුවෙන් ද 2017 , 2020 හා සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු. 786,119 ක හිඟ බදු කුලී අයකරගෙන නොතිබුණි. | ගිවිසුම්ගත වර්ග අඩි ප්‍රමාණයට පරිබාහිරව භාවිතා කරන වර්ග අඩි ප්‍රමාණයේ බඩු බාහිරාදිය ඉවත්කර ගැනීමට දැනුම් දී ඇති බව . | භාවිතා කළ වර්ග අඩි ප්‍රමාණය අනුව කුලී අයකළ යුතු අතර, විධිමත් බදු ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළයුතුය . |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

-----------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.4,970,000 ක වාහන 06 ක්, මාර්ග තලන යන්ත්‍රයක්, ඉඩමක්, වටිනාකම හඳුනා නොගත් වාහන 02 ක් හා ගොඩනැගිල්ලක් වසර 1 සිට වසර 10 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | අලුත්වැඩියා කළහැකි වත්කම් අලුත්වැඩියා කිරීමටත්, එසේ නොමැති වත්කම් අපහරණය කිරීම හා සුදුසු ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන බව . | ඉඩම් හා ගොඩනැගිලි උපයෝජනය කිරීමටත් අලුත්වැඩියා කළහැකි වත්කම් අලුත්වැඩියා කිරීමටත්, අනෙකුත් වත්කම් අපහරණය කිරීමටත් කටයුතු කළයුතුය . |

### 3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව දෛනිකව කසළ ටොන් 16.5 ක් එකතු කරන අතර ඉන් දිරන හා නොදිරන වශයෙන් වෙන් නොකරන ලද කසළ ටොන් 1½ ක් පමණ දෛනිකව වාරියපොලවත්ත කසළ අංගනයට අවිධිමත්ව බැහැර කර තිබුණි. එමෙන්ම වාරියපොලවත්ත කසළ භූමියේ එක්රැස්වන අප ජලය වර්ෂා දිනවලදී ස්වභාවික ජල මූලාශ්‍රවලට එකතුවන බව නිරීක්ෂණය විය. වාරියපොලවත්ත කසළ බැහැර කිරීමේ ඉඩම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින නඩුවකට අනුව ඉකුත් වර්ෂයේ පෙබරවාරි 20 දින හා ඊට පෙර පැවති නඩු වාර වලදී කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ලබාදී තිබුණු නිර්දේශයෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාදී නොතිබුණු අතර, අධිකරණයේ පවතින නඩු කටයුත්තද අවසන් වී නොතිබුණි. ඒ සඳහා 2018 සැප්තැම්බර් 15 දින සිට සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 06 දක්වා කාල පරාසය තුළ එකතුව රු.5,639,975ක නඩු ගාස්තුවක් ගෙවීමට සිදුව තිබුණි. | පරිසර අධිකාරිය විසින් මෙම නඩුවේ කටයුතු සිදුකරන අතර, කසළ බැහැර කිරීමට වෙනත් ඉඩමක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. නිසි කසළ කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව . | අධිකරණයේ නිර්දේශයන්ට අනුව හා පරිසර අධිකාරියේ උපදෙස්වලට අනුව පරිසරයට හානියක් නොවන අයුරින් නිසි කසළ කළමනාකරණයක් පවත්වා ගතයුතුය . |

### 3.7 ප්‍රසම්පාදනය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ v වන කොටසේ සඳහන් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව, සුභ සාධක සමිතිවල ඉල්ලීමකින් තොරව නාගරික බලප්‍රදේශයේ කොට්ඨාස 13 ක සුභ සාධක සමිති සඳහා බෙදාදීමට රු.648,700 ක කැන්වස් රෙදිවලින් සැකසූ ආවරණ (hut) 13ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 10 දින මිලදීගෙන තිබුණි. | ආණ්ඩුකාරතුමාගේ සුරතින් හට් බෙදා දීමට තීරණය වූ බැවින් කඩිනමින් මිලදී ගැනීමට සිදු වූ බව . | අවශ්‍යතාවය හඳුනාගෙන එම අවශ්‍යතාවයන් ප්‍රමුඛතා ගතකර නියමිත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර මිලදී ගැනීමට කටයුතු කළයුතුය . |

**3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බෝගහකොටුව BK - 09 විදුලි කණුව අසලින් ඇති අතුරු මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම - රු. 902,769<br>----------------------------------<br>බෝගහකොටුව BK - 09 විදුලි කණුව අසලින් ඇති අතුරු මාර්ග කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් සමිතියක් සමඟ රු.902,769 කට ගිවිසුම්ගතව ඉදිකිරීම් පවරා තිබුණි. ප්‍රධාන ඇල මාර්ගයක් හරස් කර කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය රැස්කර ගොවි බිම් සඳහා ජලය බෙදා හැරීමට ඉදිකර ඇති පැරණි අමුණකින් ආවරණය වන ජලය රැස්වන ප්‍රදේශය හා එම අමුණ දක්වා ජලය ගමන් කරන ප්‍රධාන ඇල මාර්ගයේ කොටසක් බොරලු දමා පුරවා ඒ මත කොන්ක්‍රීට් අතුරා සභිකයෙකුගේ නිවසකට යාම සඳහා යථෝක්ත මාර්ගය ඉදිකර තිබුණි. කෙසේ වුවද මේ දක්වා අදාළ ගෙවීම කර නොතිබුණි. | ව්‍යාපෘතියට අදාල මහජන විරෝධතාවයන් හේතුවෙන් තාවකාලිකව වැඩ නවත්වා විමර්ශන කටයුතු ආරම්භ කර ඇති බැවින් හා මේ සම්බන්ධව විගණන විමසුමක් ලැබී ඇති බැවින් හා විමර්ශන කටයුතු අවසන් වී නොමැති බැවින් කිසිදු ගෙවීමක් මෙතෙක් සිදුකර නොමැති බව . | අවශ්‍යතාවය හඳුනාගෙන ශක්‍යතා අධ්‍යයනයන් නිවැරදිව සිදුකර වැඩි ප්‍රතිලාභයන් ලැබෙන පරිදි ප්‍රමුඛතා ගතකර පරිසරයට හානියක් නොවන ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කළයුතුය. |

**3.9 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 1 සිට 5 දක්වා කාල පරාසය තුළ ස්ථාන මාරුවී ගිය හා වැඩ තහනම් කරන ලද නිලධාරීන් 18 කගේ ආපදා ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් එකතුව රු.2,182,686 ක් අයකර ගෙන නොතිබුණි. | පළාත් භාණ්ඩාගාරය හරහා නිරවුල් වී ඇති ණය ශේෂ, පොත් වලට ඇතුළත් කර නොමැති බව පිළිගන්නා අතර, අනෙකුත් ණය ශේෂ ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව . | ස්ථාන මාරුවී ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගතයුතුය . |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 පිළිතුරු නොලත් විගණන විමසුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව මහා නගර සභාවට ඉදිරිපත් කර තිබුණු නිකුත් කර මාස 3ක් ඉක්ම වූ විගණන විමසුම් 10 කට පිළිතුරු සපයා නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.31,955,993 ක් විය. | පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් සඳහා ඉදිරියේදී පිළිතුරු ඉදිරිපත් කරන බව. | සියලු විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කළයුතුය . |

**4.2** පාරිසරික ගැටළු

--------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සුපිරි වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ මාළු කඩ 09 ක හා මස් කඩ 03 ක අපජලය හා අපද්‍රව්‍ය කොටස් නගරයේ පොදු කාණු පද්ධතිය වෙත මුදා හැර තිබුණි. | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ගලි වලවල් 4 ක් ඇතත්, එයට කඩ හිමියන් අපද්‍රව්‍ය කොටස් මුදා හැර ඇති අතර, ඉදිරියේදී මීට අදාල සැලැස්මක් පිළියෙල කරන බව. | අපජලය පොදු කානුවට මුදා නොහැර අප ජලය මුදා හැරීම සඳහා ගලිවලවල් නිවැරදිව නඩත්තු කළයුතුය . |